තෙවන වාර පරීක්ෂණය - 2019

බුද්ධ ධර්මය

11 ශ්‍රේණිය

පිළිතුරු පත්‍රය-11

I කොටස

01 - 2	11 - 2	21 - 3	31 - 2
02 - 3	12 - 4	22 - 2	32 - 3
03 - 1	13 - 2	23 - 4	33 - 4
04 - 2	14 - 3	24 - 1	34 - 1
05 - 4	15 - 1	25 - 1	35 - 2
06 - 2	16 - 3	26 - 2	36 - 4
07 - 1	17 - 3	27 - 3	37 - 3
08 - 3	18 - 2	28 - 1	38 - 1
09 - 1	19 - 4	29 - 4	39 - 4
10 - 3	20 - 4	30 - 3	40 - 3

II කොටස

(01) i. අනේපිඬු සිටුතුමා - ජේතවනාරාමය
විශාඛා සිටුදේවිය - පූර්වාරාමය

ii. ආලවක, සුචිරෝම, බරරෝම

iii. ගන්ධකුටි, පාසාද, ගෙඩිගේ

iv. ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිත්‍යාචාරය

v. සමථ භාවනාව, විදර්ශනා භාවනාව

vi. රෝගාබාධ අඩු බව, නිදුක් බව, සැහැල්ලු පැවැත්ම, කාය බලය, සුව පහසු පැවැත්ම

vii. ආබද්ධ - අවුකන අනාබද්ධ - මාළිගාවිල

viii. ඡන්දය, ද්වේශය, භය, මෝහය

ix. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ, සිංහල බෝධිවංශය, ථූපවංශය

x. තමා උපමා කොට අනුන් ගැන සිතීම.

(02) i. දාන පාරමිතාව, සීල , නෙක්ඛම්ම, පඤ්ඤා, විර්ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපේක්ෂා පාරමිතාව

ii. එක් පාරමිතාවක් පිළිබඳව කෙටි හැඳින්වීමක් අපේක්ෂා කෙරේ. (11 ශ්‍රේණිය පිටු අංක 18-29 දක්වා)

iii. සමාජගත ජීවිතයට එක් එක් බුද්ධ කාරක ධර්ම වැදගත් වන අයුරු උදාහරණ සහිතව පැහැදිලි කර තිබිය යුතුය.

නෙක්ඛම්ම පාරමිතාව - අසීමිත ආශාවලින් තොරවීම, අඩු බලාපොරොත්තු ඇති බව, අල්පේච්ඡතාව
ප්‍රඥා පාරමිතාව - නුවණින් කටයුතු කිරීම.
විර්ය පාරමිතාව - අරමුණක් පෙරදැරිව ඒ අරමුණ සාර්ථක කරගන්නා තුරු නොපසුබට උත්සහයෙන් වීර්යයෙන් කටයුතු කිරීමේ වැදගත්කම.
ක්ෂාන්ති පාරමිතාව - ඉවසීමෙන් කටයුතු කිරීමේ අගය
සත්‍ය පාරමිතාව - සත්‍යගරුකව ක්‍රියා කිරීමේ අගය
අධිෂ්ඨාන පාරමිතාව - අධිෂ්ඨානයත් පෙරදැරිව කටයුතු කිරීම
මෛත්‍රී පාරමිතාව - මෛත්‍රී සහගත සිතුවිලි වලින් යුක්තවීමෙන් ඇතිවන සතුට
උපේක්ෂා පාරමිතාව - අන්තගාමී බවින් ක්‍රියා නොකිරීමේ අගය ලිවිය යුතුය.
දාන පාරමිතාව - පරිත්‍යාගශීලී වීමේ අගය
සීල පාරමිතාව - සිල්වත් වීමේ අගය

(03) i. අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤ මඤ්ඤං විසෝධයේ

ii. යමෙකු පව් කළොත් එයින් ඔහු ම කෙලෙසෙන්නේය.
යමෙකු පව් නොකළොත් එයින් ඔහුම පිරිසිදු වන්නේය.

පිරිසිදුකම හා අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහිමය
එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකිය.

iii. ධම්ම පදයෙන් ලබාදෙන උපදේශ සිසුන් වශයෙන් ප්‍රායෝගික ජීවිතයට යොදාගෙන සාර්ථක පුද්ගලයෙකු වීමට මඟ පෙන්වන අයුරු අනුමිත ගාථා 03 ක් වත් උපයෝගී කොට ගෙන පිළිතුර ගොඩනගා ඇත්නම් පිළිතුර දෙස බලා අදාළ ලකුණ පිරිනමන්න. (11 ශ්‍රේණිය පිටු අංක 49-53 දක්වා)

(04) i. යට දිසාව (හෙට්ඨිම දිසාව) - සේව්‍ය සේවක සබඳතාව
උඩ දිසාව - ගිහි පැවිදි සබඳතා

ii. ◆ පවින් වැළැක්වීම.
◆ යහපත් ක්‍රියාවල යෙදවීම.
◆ හොඳ හිතින්ම අනුකම්පා කිරීම.
◆ අසා නොමැති දෙය කියාදීම.
◆ අසා ඇති දෙය වඩාත් පැහැදිලි කරදීම.
◆ සුගතියට මඟ පෙන්වීම.
(සියලුම කරුණු සඳහන් කර ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.)

iii. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් සමාජ කණ්ඩායම් උදාහරණ ලෙස ගෙන මෙම ප්‍රශ්නයට අදාළ පිළිතුර ගොඩනගා ඇත්නම් සම්පූර්ණ ලකුණ පිරිනමන්න.

(05) i. පංචශීලය, සතර සංග්‍රවස්තු, සිව්බඹ විහරණ, අත්තුපනායික ධර්ම පර්යාය

ii. ඉහත කරුණු වලින් එකක් පිළිබඳව කෙටි හැඳින්වීමක් අපේක්ෂා කෙරේ.

iii. ඉහත I හි සඳහන් කරුණු ඔස්සේ බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සහජීවනයෙන් ක්‍රියා කළ යුතු අයුරු පිළිබඳව ප්‍රමාණවත් විස්තරයක් තිබීම අවශ්‍ය වේ.

(06) i සුභද්‍ර භික්ෂුවගේ නුසුදුසු වචනය,
ii රජගහ නුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණි ගුහා ද්වාරය අභියස , අජාසත්ත රජු , මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ.
iii. ★ විසිරි තිබූ ධර්ම විනය එක්රැස්කර සම්මුතියකට ගෙන ඒම,
★ ධර්ම විනය කොටස් කර භාණක පරපුරට පැවරීම.
★ නව විනය රීති නොපැනවීමටත් පැන වූ විනය නීති ආරක්ෂා කිරීමටත් ප්‍රතිඥා දීම. ආදී කරුණු බලා ලකුණු ලබා දෙන්න.

07) i ආර්ය අෂ්ටාංගික මාර්ගය :- ශ්‍රේෂ්ඨයෝ විසින් අනුගමනය කළ මඟ නිසා ආර්ය මාර්ගය නමින් හඳුන්වන බව දම්සක් පැවතුම් සූත්‍රයේ දී ආර්ය මග්ග යන වචනයක් මජ්ඣිමා පටිපදා යන්නෙන් එකට යෙදී ඇති බව.

★ ලෞකිකත්වයේ සිට ලෝකෝත්තර ගමන් කිරීමේ දී පුද්ගලයා තුළ තිබිය යුතු පිළිවෙළ පියවර බෞද්ධ ආර්ය මාර්ගය බව.

★ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි. ත්‍රි ශික්ෂා වලට බෙදු එක් එක් අංග පිළිබඳ වෙන්ව විස්තර කිරීම්ද තිබිය හැකිය. මේ කරුණු පිළිබඳ අවධානය යොමු කොට ලකුණු ප්‍රදානය කරන්න.

ii. පද්මාකාර ජීවිතය :-
- ද්‍රෝණ බමුණාට බුදුරජාණන් වහන්සේ තමන් කවුරුන්දැයි හඳුන්වා දුන් ආකාරය
- පද්මාකාර ජීවිතය යනු කුමක්දැයි ලිවීම.
- පද්මාකාර ජීවිතය බුදු සිරිතේ උදාහරණ මගින් දැක්වීම. • පද්මාකාර ජීවිතයක ලක්ෂණ ලිවීම.
- පද්ම උපමාව අනුව බුදු රජාණන් වහන්සේ වදාළ ත්‍රිවිධ පුද්ගලයන් (10 ශ්‍රේණිය)

iii. දුටුගැමුණු රජතුමා :-
මෙතුමාගේ මූලික ජීවන තොරතුරු, ජාතික, ආගමික, ශාසනික, සාමාජික වශයෙන් සිදුකළ මෙහෙය ආදී තොරතුරු ඇතුළත් කොට පිළිතුර දෙස බලා අදාළ ලකුණු පිරිනමන්න.
(10 ශ්‍රේණිය 37-39 පිටු)

iv. බෞද්ධ චිත්‍ර කලාව :-
බුද්ධ ධර්මය, බුද්ධ චරිතය හා ශාසන ඉතිහාසය පිළිබඳව ජනතාවට කරුණු ඉගැන්වීමේ සන්නිවේදන මාධ්‍යයක් ලෙස බෞද්ධ චිත්‍ර කලාව සඳහන් කළ හැකිය. අනුරාධපුර යුගයේ සිට මේ දක්වා ඇති චිත්‍ර පිළිබඳ ඒ ඒ යුගවල විශේෂත්වයන් දක්වා ඇත්නම්ද ලකුණු පිරිනමන්න. (11 ශ්‍රේණිය 132-136 පිටු)